**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ (“අධිකාරිය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු. 4,193,585 ක් වටිනාකමැති සහිත ගොඩනැගිලි තුනක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අගෝස්තු මාසයේ සිට දේපළ, පිරියත හා උපකරණ වල ඇතුලත් ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කරන ලෙස අධිකාරිය විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි අතර, මායිම් සහ හිමිකාරිත්වයේ ගැටළු හේතුවෙන් වාර්තා තවමත් ලැබී නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි අවශ්‍යතාවයට අනුකූල වීම අවශ්‍ය වීම. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය අනුව අපගමන බද්ද සඳහා වන සේවා ගාස්තු සඳහා අදායම උපචිත පදනම මත හඳුනාගත යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට ගුවන් සමාගම් හයකින් (06) ලැබිය යුතු රු.11,070,728,696 ක අපගමන බදු ගිණුම්ගත කර නොතිබුණි. එබැවින් මහා භාණ්ඩාගාරයට, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම වෙත ගෙවිය යුතු මුදල, පිළිවෙලින් රු.8,303,046,522 කින් රු.899,496,707 කින් සහ රු.1,798,993,414 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, අධිකාරියේ අපගමන බදු ආදායම මත සේවා ගාස්තුව රු.69,192,054 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අධිකාරිය විසින් ගුවන් සමාගම් සහ භාණ්ඩාගාරය අතර අතරමැදි කාර්යභාරයක් ඉටුකරන අතර භාණ්ඩාගාරය වෙනුවෙන් අපගමන බදු එකතු කිරීම සහ බෙදා හැරීම සිදු කරයි. එබැවින් ගෙවිය යුතු මුදල භාණ්ඩාගාර ජංගම ගිණුම යටතේ දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයට අනුකූල වීම අවශ්‍ය වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙසැම්බර් 31 දින දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.136,799,321 ක් වූ එකතු කළ අගය මත බද්දෙන්, ආපසු නොගෙවන වැට් බද්ද ලෙස වර්ෂය තුළ රු.127,895,303 ක් ගලපා තිබුණි. කෙසේ වෙතත්, ලැබිය යුතු ශේෂ වැට් බදු ප්‍රමාණය අයකර ගැනීම සැක සහිත බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඒ සඳහා ලියාහැරීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලැබිය යුතු වැට් බදු ශේෂයෙන් 50% ක් නිෂ්කාශනය කර ඇති අතර ඉතිරි මුදල නිෂ්කාශනය කිරීම සඳහා අඛණ්ඩ පසු විපරම් ක්‍රියා සිදුවෙමින් පවතී. 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසනු ලැබේ. | වැට් බදු ආපසු ගෙවීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගත යුතු අතර, එය තහවුරු කර නොමැති නම්, මූල්‍ය ප්‍රකාශනවල ලියාහැරීම් හෝ හෙළිදරව් කිරීම් සඳහා ප්‍රතිපාදන ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | 2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව පනතේ අංක 2 (ඇ) වගන්තියට අනුව, 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙර වසර සහ සමාලෝචිත වර්ෂය සඳහා. ආදායම් බදු නිශ්චය කිරීම සඳහා හඳුනාගත් රු.10,679,705 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බදු සඳහා ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. | 2023 මාර්තු 20 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) නිකුත් කළ ලිපියෙහි අපගමන බද්දේ සේවා ගාස්තුව SSCL සඳහා වගකීමට යටත් වන බව පෙන්වා දී තිබුණි. එම ලිපිය මත පදනම්ව, IRD විසින් 2022 ඔක්තෝබර් 01 වන දින තක්සේරු නිකුත් කරන ලදී . අධිකාරිය විසින් තක්සේරු වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කර ඇති අතර, IRD විසින් අවසන් තීරණය දැනුම් දී නොමැත. තවද, අපගමන බද්ද යනු වැට් බද්ද සහ SSCL සඳහා වගකීමට යටත් නොවන රජයේ බද්දක් බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තහවුරු කර ඇත. | අවසාන තීරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිඛිතව ඉල්ලීමක් කළ යුතු අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ (ඒ) වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු.364,495,666 ක් වන අදායම මත රු.54,674,342 ක හා 2016 දෙවන කාර්තුවේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා අපගමන බද්ද මත සේවා ගාස්තු ආදායම මත රු. 112,885,849 ක එකතු කළ අගය මත බද්දක් ගෙවීමට අධිකාරිය බැඳී සිටී. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශාල බදු ගෙවන්නන්ගේ ඒකකයේ, ලිපිය මඟින් අපගමන බද්දේ සේවා ගාස්තුව මත වැට් බද්ද අය කළේය. අධිකාරිය රජය වෙනුවෙන් සේවාවක් සපයන බැවින්, අපගමන බද්දේ සේවා ගාස්තුව ව්‍යතිරේක ආදායමක් ලෙස ප්‍රකාශ කිරීම සහ වැට් බදු ප්‍රතිලාභවල සමානුපාතිකව ආදාන බද්ද තහනම් කර ඇත යන සියලු හේතු සපයමින් CAASL තක්සේරුවලට එරෙහිව අභියාචනා කර ඇත. | අභියාචනය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු කැඳවා ඔවුන්ගේ තීරණය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. |

<table>
<tr>
<td>(ඇ)</td>
<td>රු. 1,772,902 ක් වටිනා උපකරණ අත්පත් කර ගත් ආරම්භයේ සිට අධිකාරියේ මෙහෙයුම් සඳහා භාවිතා කර නොතිබූ අතර ඒවා අධිකාරියේ ගබඩාවල සහ සෞඛ්‍ය ඒකකයේ රඳවා තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය එම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර 2022 වර්ෂයේදී නැවත තක්සේරු කර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. තවද රු. 8,582,775 ක් වටිනා වාහන දෙකක් අධිකාරියේ පරිශ්‍රයේ නිෂ්ක්‍රීයව තිබුණි.</td>
<td>පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.
<table>
<tr><th>අයිතමය</th><th>වටිනාකම (Rs)</th><th>ගත් ක්‍රියාමාර්ග</th></tr>
<tr><td>9 DVD players</td><td>28,089</td><td>මහජන ප්‍රදර්ශනවල භාවිතයට තබා ගැනීම</td></tr>
<tr><td>15 LCD Monitors</td><td>39,136</td><td>මහජන ප්‍රදර්ශනවල භාවිතයට තබා ගැනීම</td></tr>
<tr><td>Breath Analyzer tester for alcohol</td><td>1,705,677</td><td>මෙය ජපානයෙන් ලැබුණු පරිත්‍යාගයකි. මෙම කාරණය අවසන් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
<tr><td>KI-8168 Rexton Jeep</td><td>7,650,000</td><td>මෙම කාරණය අවසන් කිරීමට කටයුතු කරනු ඇත</td></tr>
<tr><td>YM - 4182 Three-Wheeler</td><td>1,000,000</td><td>මෙම කාරණය අවසන් කිරීමට කටයුතු කරනු ඇත</td></tr>
<tr><td>Total</td><td>10,422,902</td><td></td></tr>
</table>
</td>
<td>අධිකාරිය, ඒවායේ පිහිටීම, තත්ත්වය සහ භාවිතය ඉතිහාසය ඇතුළුව, සියලු වත්කම්වල විස්තීරණ දත්ත ගබඩාවක් පවත්වාගත යුතු වීම.</td>
</tr>
<tr>
<td>(ඉ)</td>
<td>2023 දෙසැම්බර් 31 දිනට රු.178,943,596 ක මුළු වටිනාකමක් ඇති ණය ගැතියන් හයක් (06) වෙත ශේෂ තහවුරු කිරීමේ ලිපි යවා තිබුණි. කෙසේ වෙතත් රු.173,193,596 ක මුළු වටිනාකමක් ඇති ණය ගැතියන් තිදෙනෙකු (03) ශේෂ තහවුරු කර නොතිබූ අතර තහවුරු කරන ලද ශේෂ සහ ලෙජර ශේෂ අතර රු.473,184 ක වෙනසක් පැවතුනි.</td>
<td>අධිකාරිය විසින් සියලුම ණය ගැතියන් සහ ණයහිමියන් වෙත විගණන අධිකාරී වෙත පිටපතක් සමඟ ශේෂ තහවුරු කිරීම් එවන ලෙස ඉල්ලා ලිපි යවා ඇත.</td>
<td>සියලුම ණය ගැතියන් වෙත නියමිත වේලාවට ලිපි යැවීම සහතික කිරීම සඳහා අධිකාරිය තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි සමාලෝචනය කර වැඩිදියුණු කළ යුතු අතර ඔවුන්ගේ වාර්තා සහ තහවුරු කිරීමේ ලිපිවල දක්වා ඇති ප්‍රමාණයන් අතර කිසියම් විෂමතාවයක් තිබේදැයි විමසිය යුතු වීම.</td>
</tr>
<tr>
<td>(ඊ)</td>
<td>ශේෂ තහවුරු කිරීම් නොලැබීම හේතුවෙන් රු. 232,644,548 ක මුළු වටිනාකමක් ඇති ණයහිමියන් අතරින්, රු.124,902,383 ක මුළු වටිනාකමක් ඇති ණය හිමියන් දොළොස් දෙනෙකුගේ ශේෂ සත්‍යාපනය කිරීමට නොහැකි විය.</td>
<td>අධිකාරිය විසින් සියලුම ණය ගැතියන් සහ ණයහිමියන් වෙත විගණන අධිකාරී වෙත පිටපතක් සමඟ ශේෂ තහවුරු කිරීම් එවන ලෙස ඉල්ලා ලිපි යවා ඇත.</td>
<td>සියලුම ණයහිමියන් වෙත නියමිත වේලාවට ලිපි යැවීම සහතික කිරීම සඳහා අධිකාරිය විසින් තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි සමාලෝචනය කර වැඩිදියුණු කළ යුතු වීම.</td>
</tr>
</table>

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක EL/01/2023 දරන නියෝගයේ 09 වැනි ඡේදයට අනුව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 ජනවාරි 12 දින නිකුත් කරන ලද අපගමන බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් සලකන විට නියෝගයේ දක්වා ඇති පරිදි නියමිත කාල සීමාව තුළ ගෙවීමට අපොහොසත් වන ගුවන් සමාගම් ප්‍රමාද වූ එක් එක් දින සඳහා ගෙවිය යුතු මුළු මුදලට අමතරව ඉහත සඳහන් නියෝගයේ 6 ඡේදයේ සඳහන් පොළිය ගෙවීම අවශ්‍ය වේ. 2023 දෙසැම්බර් 31 වන විට, ගුවන් සමාගම් හයකින් අයවිය යුතු හිඟ අපගමන බද්දෙහි ප්‍රමාද පොළිය රු. 1,408,373,43 ක් විය. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා අධිකාරියට මෙම පොලී ගාස්තු අයකර ගැනීමට තවමත් නොහැකි වී තිබුණි. | අතපසු වීමක් හේතුවෙන් සිදු වූ සිදුවීම් කිහිපයක් හැර ගුවන් සමාගම් විසින් අපගමන බද්ද ගණනය කිරීම සඳහා ගුවන් ගමන් දිනයට අදාළ විනිමය අනුපාතිකය අදාළ නොකළ නමුත් පසුව ඒ සියල්ල නිවැරදි කරන ලදී. CAASL 015 - (23-1) ඉදිරිපත් කළ නොහැකි වූ ගුවන් සමාගම් ටිකට් නිකුත් කළ දිනය මත පදනම්ව පරිවර්තන විස්තර ලබා දී ඇත. ප්‍රවේශපත්‍ර නිකුත් කළ දිනය මත පදනම්ව ප්‍රතිලාභයේ පරිවර්තන ගාස්තු විස්තර ගුවන් සමාගම් විසින් සපයා තිබුණි | අපගමන බද්ද අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවන පහත අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත | | | |
| | (i) වගන්තිය 7(ඇ) | අධිකාරිය විසින් ශ්‍රී ලංකාව සඳහා වන ගුවන් සේවා සංවර්ධන සැලැස්ම සකස් කළ යුතු වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් එය සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි. | 2024 පෙබරවාරි 26 දින පැවති 197 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා 10 අවුරුදු විස්තීරණ සැලසුම් රාමුවක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය සඳහා ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රධාන සැලැස්ම (NCAMP) ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දී ඇත. මේ අතර, | අධිකාරිය, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) විසින් CAMP වෙත යෝජිත සංශෝධනයක් ඉදිරිපත් කර ඇත. CAASL විසින් මේ වන විට සංශෝධනය සමාලෝචනය කරමින් සහ සලකා බලමින් සිටින අතර, යෝජිත වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව, CAMP ජාතික සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත. | |
| (ii) වගන්තිය 7(ඌ) | 2010 අංක 14 සිවිල් ගුවන් සේවා පනතේ 56 වැනි වගන්තියට අනුව අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් සමන්විත ගුවන් යානා විමර්ශන මණ්ඩලයක් පත්කර ශ්‍රී ලංකා භූමිය තුළ සිදු වූ ගුවන් යානා අනතුරු පිළිබඳ විමර්ශනය ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි මණ්ඩලයක් පත් නොකර අධිකාරිය විසින් 2006, 2009 සහ 2010 වසරවලදී පිළිවෙළින් රු. මිලියන 20ක්, රු.මිලියන 10ක් සහ රු. මිලියන 20ක් අනතුරු අරමුදලට වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2016 ජූලි 26 දිනැති අංක CP/16/375/709/063 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ලංකා ගුවන් යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් පිහිටුවීමට තීරණයක් ගෙන ඇති අතර, ඒ සඳහා සභාපතිවරයෙකු සහිත කාර්ය මණ්ඩලයක් පත් කිරීමටත් ඒ සමඟම රේඛීය අමාත්‍යාංශ හෝ අධිකාරියේ අයවැයෙන් රු.මිලියන 50 ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමටත් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් අධිකාරිය කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීමට අදාලව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ස්වාධීන ගුවන් යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් (AAIB) පිහිටුවීමේ කැබිනට් තීරණය ශ්‍රී ලංකාවේ පැවති ICAO විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණනය මගින් මතු කරන ලද සොයාගැනීම්වලට ප්‍රතිචාර වශයෙන් රජය විසින් යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයකි. නීති කෙටුම්පත් සම්පාදකවරයා සමඟ සාකච්ඡා කර එකී නීති සම්පාදනය කිරීමට 2016 වසරේ සිට මෙම අධිකාරිය අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර එය දැන් අවසන් අදියරේ පවතී. AAIB පනත් කෙටුම්පතට අනුව, අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති සංවිධාන ව්‍යුහය සම්මත කර ගැනීමට ප්‍රතිපාදන ඇත. තවද, සිවිල් ගුවන් සේවා විෂය පවරන ලද අමාත්‍යවරයාගේම වැය ශීර්ෂයෙන් වාර්ෂිකව රු. මිලියන 50ක අරමුදලක් වෙන් කිරීමට ප්‍රතිපාදන ඇත. 2010 අංක 14 දරන CA පනතේ අදාළ වගන්ති අවලංගු කිරීමට AAIB පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන ඇත. | අධිකාරිය විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) වගන්තිය 9 | පනතේ දෙවන උපලේඛනයේ සඳහන් ගුවන් යානා 14 ක් සහ පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් ගුවන් යානා පහසුකම් 08 ක් සහ ඊට අදාළ ඉඩම, 2016 වසර වන විට ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. පනත සම්පාදනය කර වසර 21ක් ගතවී ඇතත් පනතේ සඳහන් ගුවන් තොටුපළ 10ක් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 දී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයට පසුව, CAASL විසින් හිමිකම් ලැබීමේ සහ පැවරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියාමාර්ග මාලාවක් ගෙන ඇත. මෙම වසර පහ තුළ මඩකලපුව ගුවන් තොටුපළ සහ මඩම්පැල්ල රේඩියෝ නාවික ආධාර, අත්තිඩියේ ගුවන් සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය සහ කඳවල සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය ඇතුළු ගුවන් පහසුකම් තුනක් 2022 අගෝස්තු 17 දින අංක 2293/33 සහ 2023 පෙබරවාරි 23 දින අංක 2320/63 දරන අති විශේෂ ගැසට් පත්‍ර මගින් දේපළවල පැහැදිලි මායිම් සහිතව නැවත ගැසට් කර ඇත. තවද, 2017.12.21 දිනැති අංක 2050/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ලැයිස්තුගත කර ඇති ඉතිරි දේපළ නැවත ගැසට් කිරීමට කටයුතු කර ඇත. මෙම අධිකාරිය විසින් කරන ලද ඉල්ලීම් අනුව රත්මලාන, මීගමුව, නුවරඑළිය සහ කටාන යන ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සංශෝධිත ගැසට් පත්‍ර ඉදිරියට ගෙන යාමට කටයුතු කරන ලදී. රාජ්‍ය ප්‍රදානයක් ලෙස මායිම් නැවත ගැසට් කිරීමට සහ දේපළ ලබා ගැනීමට අවශ්‍ය පරිපාලන කටයුතු සිදුවෙමින් පවතින අතර ඒ සඳහා විවිධ රාජ්‍ය සංවිධානවල මැදිහත්වීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මාලාවක්ගත යුතු බැවින් තවත් දීර්ඝ කාලයක් ගත වේ. | අධිකාරිය 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පනත අනුගමනය කළ යුතු වීම. |
| (iv) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 09 වන වගන්තිය. | 2019 අප්‍රේල් 02 දිනැති ගැසට් පත්‍රය මගින් සහ අංක CP/19/2008/105/009-1 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය මත යාපනය ගුවන් තොටුපළ සඳහා ලබා දුන් අනුමැතිය අනුව යාපනය ගුවන් තොටුපළ ගැසට් පත්‍රය මගින් සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා දී ඇත. 2019 ඔක්තෝබර් 17 වැනි දින ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. යාපනය ගුවන් තොටුපල අක්කර 2962.18 ක | පිළිතුර ලැබී නැත. | අධිකාරිය 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පනත අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉඩම්වල මායිම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය අධිකාරිය විසින් අවසන් කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල (EPF) පනතේ 47 වැනි වගන්තිය, 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල (ETF) පනතේ 44 වැනි වගන්තිය සහ 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | EPF සහ ETF පනත්වල අර්ථ දක්වා ඇති ඉපැයීම්වලට පටහැනිව, අධිකාරිය විසින් EPF සහ ETF දායකත්වය ගණනය කිරීමේදී විවිධ දීමනා වර්ග 7ක් ඇතුළත් කර ඇත. මෙම වැරදි ගණනය කිරීම නිසා, 2020-2023 නියැදි පරීක්ෂා කාලය තුල රු.125,145,338 ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට හා රු.15,017,440 ක මුදලක් සේවක භාරකාර අරමුදලට වැඩියෙන් බැර කර තිබුණි. 2020 සඳහා වූ මූලික පරීක්ෂණ කාලය සඳහා. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත සහ 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල යටතේ CAA දීමනා "ඉපැයීම්" යටතට ඇතුළත් වේද යන්න පිළිබඳව අදහසක්/උපදෙසක් ලබාගැනීම සඳහා කම්කරු කොමසාරිස්වරයා වෙත ලිපියක් ලිවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් දී ඇත. 2024.05.14 දින එම ඉල්ලීම කම්කරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. කම්කරු දෙපාර්තමේන්තුව දන්වා සිටියේ, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තරව උපදෙස් ලබා ගත යුතු බැවින් පැහැදිලි කිරීමක් ලබා දීමට සාධාරණ කාලයක් ගත වන බවයි.<br>ඉහත දැනුම් දුන් පරිදි, මෙම අධිකාරිය ආරම්භයේ සිටම EPF සහ ETF අරමුණු සඳහා මෙම දීමනා සලකා බලා ඇති අතර, හදිසි වෙනසක් CAA සේවකයින් අතර නොසන්සුන්තාවයක් ඇති කළ හැකියි. එය CAA හි ක්‍රියාකාරිත්වයට බාධාවක් වනු ඇත. CAASL කම්කරු දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තුවෙන් සිටින අතර CAASL විසින් පනතේ විධිවිධාන අනුව EPF සහ ETF ගණනය කිරීමට පියවර ගෙන ඇත. | EPF සහ ETF ගණනය කිරීම පනතේ ඇතුළත් නිර්වචනය අනුව සිදු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ( අති විශේෂ ) ගැසට් පත්‍රය | අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරන ලද පරිදි රු.3,776,266,598 ක අපගමන බද්ද ලෙස එකතු කළ යුතු මුදල් සඳහා සුරක්ෂිතයක් ලෙස බැංකු ඇපකරයක් හෝ මුදල් ඇපයක් ගුවන් සමාගම් හතක් (7) ක් විසින් ලබා දී නොතිබුණි. | ගුවන් සමාගම් අපගමන බද්ද සඳහා සුරක්ෂිතයක් ලෙස බැංකු ඇපකර ලබා දී ඇත. සඳහන් කළ ගුවන් සමාගම් ලැයිස්තුවට පහත සඳහන් දෑ ඇතුළත් විය.<br>• කාලසටහන් අනුමැතිය ලබා ගැනීමෙන් පසු සක්‍රියව ක්‍රියාත්මක නොවන,<br>• ඇපකරය සඳහා මුදල් තැන්පතු ලබා දී ඇති සහ<br>• බැංකු ඇපකරය කල් ඉකුත් වීමට මාසයකට වඩා වැඩි කාලයක් ඇති ඒවා | අපගමන බද්ද ලෙස අයකර ගන්නා මුදල් සඳහා ඇපකරයක් ලෙස අධිකාරිය බැංකු ඇපකරයක් හෝ මුදලක් ලබා ගත යුතු වීම. |
| (ඈ) | 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ 07 සහ 08 වගන්ති සහ 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | ගැසට් මගින් නියම කර ඇති පරිදි, එකතු කරන ලද විදේශීය විකුණුම් අධිභාරය (OSS) ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, ගැසට් නිවේදනය ආරම්භයේ සිටම OSS ආදායම, ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම ලෙස ලෙස හඳුනා ගෙන තිබුණි. තවද, 2023 නොවැම්බර් 28 දිනැති අංක 23/1937628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අදාළ අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස ද අමාත්‍ය මණ්ඩලය විසින් අධිකාරියට නියම කර තිබුණි. ඒ අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් රඳවා ගත් ඉපැයීම් ඒ කාබද්ධ අරමුදලට. ප්‍රේෂණය කරන ලෙස ද උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් අධිකාරිය රඳවා ගත් ඉපැයීම් ප්‍රේෂණය කර නොතිබුණි. | 2023.11.20 දිනැති පළමු කැබිනට් තීරණය සහින් සියලු OSS ආදායම, මාරු කරන ලෙස ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත්, ගරු. සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා මෙම තීරණයට සංශෝධිත කැබිනට් පත්‍රිකාවක් සහ නිසි සාධාරණීකරණයක් සහිතව අභියාචනයක් ඉදිරිපත් කළේය. නීත්‍යානුකූල ප්‍රමුඛතාවයක් ඇති 2024/02/19 දින 2 වැනි කැබිනට් තීරණය, ගරු 2023 නොවැම්බර් 20 වැනි දින අංක 23/1937/628/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ අන්තර්ගතය සහ ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගන්නා ලදී. අමාත්‍යවරයාගේ අභියාචනා කළ කැබිනට් පත්‍රිකා යොමුව - සටහන/197/පෙබරවාරි/2024/04 සහ අමාත්‍ය මණ්ඩලය වැඩිදුරටත් තීරණය කළේ CAASL හට එහි වියදම් සඳහා මසකට රු. මිලියන 90 ක OSS ඉපැයීම් රඳවා ගත හැකි බවයි. 2024/02/19 දිනැති 2 වැනි කැබිනට් තීරණය මගින් පළමු කැබිනට් තීරණය අවලංගු කර ඇති බව නීතිමය ආස්ථානයෙන් මණ්ඩලයේ අදහසයි. ඒ අනුව, 2023/11/20 දිනැති පළමු කැබිනට් තීරණයේ සිට බලපැවැත්වෙන, 2024/02/19 දිනැති කැබිනට් තීරණයට අනුව නියමිත OSS මුදල් ප්‍රේෂණය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. CAASL විසින් ගරු. මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අංක 2(අ) සහ අදාළ රෙගුලාසි | අමාත්‍ය මණ්ඩල තීරණ හා භාණ්ඩාගාර උපදෙස්වල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සංශෝධනයක් සඳහා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් දැනටමත් ඉදිරිපත් කර ඇත. තවද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2024 අප්‍රේල් 22 දිනැති අංක TO/REV/01/14/14-11 ලිපිය මගින් CAASL වෙත එවන ලෙස උපදෙස් දී ඇත්තේ සම්පූර්ණ OSS බද්ද ප්‍රේෂණය කිරීමට නොව 2024/02/19 දිනැති කැබිනට් තීරණය මත පදනම්ව මාසික පදනමින් රු. මිලියන 90 ක් රඳවා ගැනීමෙන් පසු OSS ආදායම ප්‍රේෂණය කරන ලෙස බව ඔබට කාරුණිකව දන්වා සිටිමු. ඉහත කරුණු අනුව, පාර්ශවකරුවන් වෙත නිවැරදි මූල්‍ය තත්වයක් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි අයිතම අංක 01 හි පිළිතුරට අනුව 2023 සඳහා සුදුසු ප්‍රතිපාදන සහිත මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කිරීමට ඔබගෙන් අවසර ඉල්ලා සිටිමි. | |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය මගින් සංශෝධිත 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද. දින 116ක ප්‍රමාදයකින් යුතුව 2024 ජුනි 24 දින මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පිළිතුර ලැබී නැත. | අධිකාරිය චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම. |
| (ඊ) | 2023 දෙසැම්බර් 05 දිනැති අංක CP/23/2271/604/221 දරන කැබිනට් තීරණය | 2022 වසර සඳහා ශුද්ධ ලාභයක් උපයා ඇති බව අධිකාරිය, කැබිනට් සංදේශයේ සඳහන් කර තිබුණද, අධිකාරිය විසින් ඉහත ශුද්ධ ලාභය ගණනය කර ඇත්තේ, එක්රැස් කර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු විදේශීය විකුණුම් අධිභාරය (OSS), අධිකාරියේ ආදායම ලෙස ලබා | මෙම තීරණය සමඟ 2020,2021 සහ 2022 වසර සඳහා ලාභය වෙනස් වී නොමැත. 2023 වසරේ රු.4,600,480,452 ක ලාභය රු.360,288,651 කින් අඩු වීමක් පමණක් සිදු වේ. | අමාත්‍ය මණ්ඩලයට වාර්තා කරන තොරතුරුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය අධිකාරිය විසින් සහතික කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීමෙන් අනතුරුවය. ඒ අනුව, 2022 පාදක වර්ෂයේ රු.33,190,535 ක පාඩුවක් උපයා ඇති බැවින් අධිකාරියට රු.9,060,561 ක ප්‍රසාද දීමනාවක් ගෙවිය නොහැක. | | |
| (ඇ) | 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ආකාරයක දිරිගැන්වීමක් මත පදනම්ව කිසිදු දිරි දීමනාවක් නොගෙවන ආයතන සඳහා ඉහත ප්‍රසාද දීමනාව ගෙවිය හැකි වුවද, අධිකාරිය විසින් ඉහත ප්‍රසාද දීමනාවට අමතරව රු.63,165,455 ක දීමනා ගෙවා තිබුණි. | අංක PED/04/2023 දරන PED චක්‍රලේඛය කාර්ය සාධනය, පැමිණීම හෝ වෙනත් දිරිගැන්වීම් මත දිරි දීමනා ගෙවන විට දිරි දීමනා ගෙවිය නොහැකි බව සඳහන් කර නැත, එවැනි දීමනා ගෙවන්නේ නම් හෝ CAASL විශේෂ කැබිනට් අනුමැතිය නොමැතිව ගෙවා ඇති නම් ප්‍රසාද මුදල චක්‍රලේඛයේ සඳහන් ප්‍රමාණයෙන් පමණක් වෙනස් වේ. | අධිකාරිය චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම. |
| (ඈ ) | 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 2.3 වගන්තිය | අධිකාරියේ ක්‍රියා පටිපාටි අත්පොත් අවම වශයෙන් වසර 5කට වරක්වත් සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විට අධිකාරියේ අත්පොත් 44ක් යාවත්කාලීන කර නොතිබුණි. | මාණ්ඩලික සහ පරිපාලන නීති අත්පොත (SLCAP 5000) හි පළමු සමාලෝචනය අවසන් කර ඇති අතර 2 වන සමාලෝචනය සකස් වෙමින් පවතී. අනෙකුත් අත්පොත් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) අවශ්‍යතා අනුව සංශෝධනය කෙරේ. | අධිකාරිය චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම. |
| | (ii) 3.2 වගන්තිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන චක්‍රලේඛ ප්‍රතිපාදනවලට පටහැනිව, විශේෂ දීමනාව, කළමනාකරණ දීමනාව සහ අතුරු දීමනාව ලෙස එකතුව රු.73,103,022 ක් අධිකාරියේ නිලධාරීන්ට ගෙවා තිබුණි. | **කළමනාකරණ දීමනාව**<br>මෙම දීමනාව 2018 වසරේ සිට ගෙවා ඇති බැවින් සහ පහත හේතු නිසා මෙම අධිකාරියට තීරණය ආපසු හැරවිය නොහැක.<br>- අදාළ දීමනාව ගෙවීම නතර කළේ නම්, සියලුම කළමනාකරණ කාණ්ඩයේ නිලධාරීන්ට ණය වාරික ගෙවීමේදී ගැටලුවකට මුහුණ දීමට සිදුවනු ඇත;<br>- ගෙවීම් අත්හිටුවීම කළමනාකරු කාණ්ඩයේ නිලධාරීන්ගේ ආයතනික තත්ත්වයට සහ ජීවන තත්ත්වයට දැඩි ලෙස බලපානු ඇත.<br>- ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ ප්‍රවාහන විධිවිධාන සලසා ගෙන ඇති බැවින් ඔවුන් විසින් සිදුකරනු ලබන ගුවන් සේවා කර්මාන්තයේ නිරීක්ෂණ කටයුතු | දීමනා සඳහා අධිකාරිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අඛණ්ඩව පවත්වාගෙන යාමට උපකාරී වේ;<br>**අතුරු දීමනාව**<br>2024.01.19 දින පැවති 196 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එක් එක් සේවකයාගේ අතුරු දීමනාවෙන් රු. 10,000 බැගින් අඩු කිරීමට සහ OMS චක්‍රලේඛ අංක 01 /2024 මගින් වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව වැඩි කිරීමට තීරණය කර ඇත.<br>**විශේෂ දීමනාව**<br>අංක 01/2022 හා 2022.01.18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන සහ 2022.01.28 දින පැවති 177 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මගින් ගනු ලැබූ තීරණය අනුව රු. 5000 ක විශේෂ දීමනාව ගෙවනු ලැබේ.<br>**තාක්ෂණික දීමනාව**<br>"ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ සම්මුතිය යටතේ රජයට පැවරී ඇති ජාත්‍යන්තර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආරක්ෂිත අධීක්ෂණ හැකියාවන් ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවක්." යන මැයින් 2015.04.09 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක DMS/1748 දරන ලිපියේ සඳහන් විධිවිධාන අනුව තාක්ෂණික දීමනාව ගෙවනු ලැබේ. | |
| (එ) | 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 මස පෙන්වීම | අධිකාරිය උත්සව කටයුතුවලට අදාළව කිසිදු වියදමක් නොදැරිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් උත්සව කටයුතු සඳහා රු. 1,152,344 ක මුදලක් වැය කර තිබුණි. | 2023 වසර තුළ උත්සව කටයුතු සඳහා වන පිරිවැය අවම කිරීමට CAASL පියවර ගෙන ඇත. 2022 සහ 2021 වසරවලට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ.2022 වසරට සාපේක්ෂව 84% ක අඩුවීමකි.<br>කෙසේ වෙතත්, CAASL හි කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රධාන වශයෙන් අභිප්‍රේරණ සාධකයක් ලෙස ජනවාරි 1 වන දින උත්සවය, සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වැනි ප්‍රධාන ප්‍රධාන සැමරුම් සඳහා වියදම් කිරීමට සිදු විය. | අධිකාරිය චක්රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු වීම. |
| (ඒ) | මුදල් රෙගුලාසි 101, 103 & 104 | 2022 මැයි 18 වන දින වීරවිල සංචාරක බංගලාවේ කොටසක් ගින්නකින් හානි වී ඇති අතර, | CAASL හි 83 වැනි විගණන හා කළමනාකරණ කමිටුව විසින් දුම්දු කේටර්ස්හි රු.252,000/- ක | F.R. 101-104 අනුව අධිකාරිය ක්‍රියා කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සංචාරක බංගලාවේ කළමනාකරණ සහ නඩත්තු සේවා සපයන්නා විසින් අධිකාරියේ උපදෙස් පරිදි ක්‍රියා කර නොතිබුණු නමුත් අධිකාරිය මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි. | බැඳුම්කරය නිදහස් කර වහාම අලුත්වැඩියා කිරීමට නිර්දේශ කරන ලදී. අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | |
| (ඔ) | 2015 අප්‍රේල් 09 දිනැති අංක DMS/1748 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය | තාක්ෂණික දීමනාව වලංගු බලපත්‍ර හෝ සහතික ඇති නිලධාරීන් සඳහා පමණක් ගෙවිය යුතු වන අතර, අධිකාරිය විසින් බලපත්‍ර හෝ සහතිකවල වලංගුභාවය තහවුරු නොකර නිලධාරීන් 27 දෙනෙකුට රු.32,033,682 ක තාක්ෂණික දීමනා ගෙවා තිබුණි. | “ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ සම්මුතිය යටතේ රජයට පැවරී ඇති ජාත්‍යන්තර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආරක්ෂිත අධීක්ෂණ හැකියාවන් ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවක්.” යන මැයින් 2015.04.09 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක DMS/1748 දරන ලිපියේ සඳහන් විධිවිධාන සහ විශේෂ තාක්ෂණික දීමනාව ගෙවීම සඳහා ඇගයීම් මණ්ඩලයේ නිර්දේශය සහ මාණ්ඩලික කමිටුවේ අනුමැතිය මත විශේෂ තාක්ෂණික දීමනාව ගෙවනු ලැබේ. | බලපත්‍රවල හෝ සහතිකවල වලංගුභාවය තහවුරු කළ යුතු වීම. |
| (ඕ) | කාර්ය මණ්ඩල සහ පරිපාලන නීති අත්පොතේ 5.2.6 සහ 5.2.8 වගන්ති | අධිකාරියේ සෑම තනතුරු නමයකම ඇති තනතුරු සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු අතර අධිකාරියේ ඉල්ලීම පරිදි මහා භාණ්ඩාගාරයටය විසින් තාවකාලික තනතුරක් ඇති කළ හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් නම් කරන ලද නිලධාරීන් (Designated Officers) 13 දෙනෙකු පත් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන රු.44,990,350 දීමනා ගෙවා තිබුණි. | වැඩ පැවරුම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය නොවේ. CAA පනතේ 11 වන කොටසේ 7 (v) වගන්තියට අනුව, කොන්ත්‍රාත්තුවේ අවශ්‍ය පරිදි සුදුසුකම් ලත් පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව ඔවුන්ගේ වේතන සැපයීමට අධිකාරියට බලය ඇත. මාණ්ඩලික සහ පරිපාලන නීති (SLCAP 5000) අත්පොතෙහි 5.2.10 ඡේදය සේවා අවශ්‍යතා ඇති අවස්ථාවලදී අනුමත සේවක සංඛ්‍යාවෙන් පිටත විශේෂ පැවරුම් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට CAASL හට බලය ඇත. 2017 ජූලි 27 වන දින පැවති 136 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, විශේෂ තාක්ෂණික විශේෂඥතාවක් අවශ්‍ය රාජකාරි ඉටු කිරීම සඳහා පැවරුම් පදනම මත කර්මාන්තයෙන් නම් කරන ලද පරීක්ෂකවරුන් පත් කිරීමට තීරණය කරන ලදී. | පත්වීම් සඳහා අධිකාරිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ක) | කාර්ය මණ්ඩල සහ පරිපාලන රීති අත්පොතෙහි 14.5.1 | දේපළ ණය සහ වාහන ණය සඳහා පොලී අනුපාතය සියයට 7ක් විය යුතු වුවද, අත්පොත | 2023 ඔක්තෝම්බර් 11 දින පැවති එහි 193 වන රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වාහන සහ දේපල ණය සඳහා පොලී | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අත්පොත අවශ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| සහ වගන්ති | 14.8.2.(IV) | ආරම්භයේ සිට අධිකාරිය අය කර තිබුණේ සියයට 4.2ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නියැදි විගණනයේදී අනාවරණය වූ පරිදි, 2022 සහ 2023 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. 2,108,585 සහ රු. 1,792,073 ක ණය පොලී අදායම් අධිකාරියට අහිමි වී තිබුණි. | අනුපාතිකය 7% දක්වා වැඩි කිරීමට අනුමත ලබා දෙන ලදී. | යැයි සලකන විට අධිකාරිය විසින් සංශෝධනය කළ හැකි අතර එම සංශෝධන අත්පොතේ 1.10 වගන්තිය අනුව ක්‍රියාත්මක කිරීමට පෙර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,348,278,597 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 2,743,243,673 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,605,034,924ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු. 582.342,104 කින් එනම් සියයට 16 කින් ඉහළ යාම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. 679,995,027 කින් එනම් සියයට 117 කින් වැඩිවීම ප්‍රධාන අදායම් හා වියදම් අයිතමවල ප්‍රමාණාත්මක විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | 2023 | 2022 | විචලනය | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| මෙහෙයුම් ආදායම | 4,267,567,018 | 3,685,224,914 | 582,342,104 | 16 |
| විදේශ මත වූ විකුණුම් අධිභාරය | 3,771,642,993 | 3,376,434,208 | 395,208,785 | 12 |
| අපගමන බද්ද මත සේවා ගාස්තුව | 364,495,616 | 227,543,076 | 136,952,540 | 60 |
| නියාමන සේවා වලින් ලැබෙන ආදායම | 131,428,409 | 81,247,630 | 50,180,779 | 62 |
| මෙහෙයුම් නොවන ආදායම | 1,263,072,786 | 583,077,759 | 679,995,027 | 117 |
| කාර්ය මණ්ඩල වියදම් | 432,938,638 | 457,695,055 | (24,756,417) | (5) |
| මුළු අදායම | 10,231,145,460 | 8,411,222,642 | 1,819,922,818 | 22 |
| පරිපාලනය සහ අනෙකුත් වියදම් | 365,420,451 | 260,886,367 | 104,534,084 | 40 |
| පුහුණු වියදම් | 9,659,098 | 1,474,290 | 8,184,808 | 555 |

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) පෙර වසර හා සසඳන විට, සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම සියයට 30 කින් එනම් රු.1,262,337,131 කින් වැඩි වී තිබේ. භාණ්ඩාගාර බිල්පත් සඳහා ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලී ආදායම සහ විදේශීය මත වූ විකුණුම් අධිභාර ආදායම පිළිවෙලින් රු. 576,580,663 ක් සහ රු. 395,208,785 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

(ආ) පෙර වසරට සාපේක්ෂව පරිපාලන සහ අනෙකුත් වියදම් සහ පුහුණු වියදම් පිළිවෙලින් රු. 104,534,084 කින් එනම් සියයට 40 කින් සහ රු. 8,184,808 කින් එනම් සියයට 555 කින් වැඩි වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| අනුපාත වර්ගය | 2023 | 2022 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1:2.25 | 1:2.34 |
| ශුද්ධ ලාභ අනුපාතය | 79% | 64% |
| ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | 63% | 42% |

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) 2022 වර්ෂයේ ජංගම අනුපාතය 1:2.34 වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසන් වන විට 1:2.05 දක්වා අඩු වී තිබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදේශ මත වූ විකුණුම් අධිභාරය (OSS) ඉහළ යාමයි.

(ii) අධිකාරියේ ආදායම වැඩිවීම නිසා ශුද්ධ ලාභ අනුපාතය ඉහළ ගොස් තිබුණි.

(iii) පෙර වසරට සාපේක්ෂව ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය සියයට 63 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජාතික අයවැයෙන් අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, PPP විධිවිධාන හරහා දිගන, බදුල්ල සහ පුත්තලම යන ස්ථානවල නව අභ්‍යන්තර ගුවන් තොටුපළ තුනක් ස්ථාපිත කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව, බදුල්ල ගුවන් තොටුපළ සඳහා වන සමීක්ෂණ සැලසුම් සහ පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සකස් කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් රු.2,013,605 ක ගෙවා | බදුල්ල ගුවන් තොටුපලේ ශක්‍යතා අධ්‍යයනය, මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලක ගාස්තු, EOI සඳහා EIA ඉල්ලුම් කිරීමේ පුවත්පත් දැන්වීමක් සහ සමීක්ෂණ ගාස්තු සඳහා ගෙවීම් පියවා ඇත. පුත්තලම ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා සමීක්ෂණ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලන ගාස්තු අය කළ නමුත් කැබිනට් තීරණය අනුව ව්‍යාපෘතිය නතර විය. දිගන ගුවන් තොටුපළක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම සඳහා කමිටුව පමණක් පත් කර තිබුණි. | සංවර්ධන කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කල යුතු වීම. |

තිබුණු අතර වර්තමානය වන විට මෙම ගුවන් තොටුපළවල් තුනේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ කාර්ය මණ්ඩල සහ පරිපාලන අත්පොතෙහි 1.4 වගන්තියට අනුව, අධිකාරියේ ආයතනික පාලනයේ රීති කාර්ය මණ්ඩල හා පරිපාලන නීති, ආයතනික නීති සහ මූල්‍ය නීති ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. අත්පොත අනුව මූල්‍ය රීති වෙන වෙනම නිකුත් කළ යුතු වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා මූල්‍ය රීති නිකුත් කර නොතිබුණි. | CAASL හි මූල්‍ය හා ආදායම් කළමනාකරණය විසින් මෙම අත්පොත 2016 වසරේදී සකස් කරන ලදී. මෙම ලේඛනය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර, කමිටුව විසින් අත්පොත නිර්දේශ කර 2018 වසරේ එහි 61 වන රැස්වීමේදී අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත.<br>කෙසේ වෙතත්, රටේ පවතින විවිධ තත්වයන් හේතුවෙන් හා අත්පොතෙහි සමහර විධිවිධාන දැනට පවතින නීතිමය පනත් වලට පටහැනි වීම මෙම කාරණය වෙනස් වූ අතර, අධ්‍යක්ෂ/FRM විසින් 195 වන මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අත්පොත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය ක්‍රියා පටිපාටි අත්පොත සමාලෝචනය කර එහි සංශෝධන ඉදිරිපත් කිරීමට මණ්ඩලය තීරණය කළේය. මෙම අත්පොත 2024 වසර අවසන් වන විට අවසන් වේ. | කාර්ය මණ්ඩල සහ පරිපාලන අත්පොතෙහි රීති 1.4 වගන්තියට අනුව අධිකාරිය කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගුවන් යානා පහසුකම් සහ ඉඩම් විධිමත් බදු ගිවිසුමක් හෝ කුලී ගාස්තුවකින් තොරව සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් භාවිතා කර ඇත. | ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම්ව, දැනට මෙම දේපල භාවිතා කරයි. දීර්ඝ කාලීන බදු ක්‍රමයක් සහ නීතිමය තත්ත්වය මත ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. නීතිපති. CAASL විසින් මඩකලපුව ගුවන් තොටුපළ ක්‍රියාත්මක කිරීම සඳහා බදු ගිවිසුමක් සකස් කර එය සමාලෝචනය සඳහා AASL වෙත යවා ඇත. මඩකලපුව ගුවන් තොටුපළ බදු ගිවිසුම අවසන් කිරීමෙන් පසු අනෙකුත් ගුවන් තොටුපළ සහ ගගනගාමී පහසුකම් සඳහා එම ක්‍රියා පටිපාටියම අනුගමනය කරනු ඇත. | අධිකාරිය ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ( ලංකාශ්‍රී) පුද්)ගලිකසමාගම සමඟ බදු ( ගිවිසුමට එළඹිය යුතු අතර තුන්වන උපලේඛනයේ දක්වා ඇති ගුවන් යානා පහසුකම් සහ ඉඩම සඳහා කුලී ගාස්තු .අය කළ යුතුය |
| (ඇ) | 2010 අංක 14 සිවිල් ගුවන් සේවා පනතේ 124 වගන්තියට අනුව, ගුවන් ප්‍රවාහන ව්‍යාපාරය යන්නෙන් අදහස් කරන්නේ (ගුවන් යානයක ක්‍රියාකරුවෙකු හෝ ප්‍රධානියෙකු හෝ නියෝජිතයෙකු ලෙස) ශ්‍රී ලංකා ගුවන් අවකාශයට ඇතුළු වීම සහ ශ්‍රී ලංකාවෙන් පිටවීමට අදාළ ලියාපදිංචි | ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතායතන නියමනයේ අරමුණ ආදායම ඉපයීම නොව අතර මහජන ආරක්ෂාව තහවුරු කිරීමයි.<br>ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ මූලික අරමුණ ගුවන් ප්‍රවේශ හා ගුවන් විධිමත්ව නිකුත් කිරීම ගුවන් තහවුරු කරමින් ආරක්ෂාව තහවුරු කිරීමයි. සිවිල් ගුවන් සේවා අධිකාරිය මෙම ක්‍රියාවලිය මඟින් මූල්‍ය | අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගුවන් ගමන් ද ඇතුළුව (ශ්‍රී ලංකාවේ හෝ නොමැති) ගුවන් යානයකින් ලොව කොතැනක හෝ ගුවන් ගමනකදී පුද්ගලයින්, භාණ්ඩ හෝ තැපැල් රැගෙන යාම සඳහා පහසුකම් සැපයීමයි. නමුත් අධිකාරිය මෙම වාර්තාවේ දිනය දක්වා ගුවන්යානා මගින් භාණ්ඩ සහ තැපැල් රැගෙන යාම සඳහා සේවා සපයන්නන් හඳුනාගෙන නොමැති අතර, ඉහත සඳහන් සේවා දෙක සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි. එබැවින්, අධිකාරියට මෙම සේවා දෙකෙන් ආදායම උපයා ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිලාභ උපයාගැනීමට අරමුණු කර ඇත. | |
| (ඇ) | 971 / 5,000 අවලංගු වූ බලපත්‍රයක් සහිතව ව්‍යාපාර පැවැත්වීම දඬුවම් ලැබිය හැකි වරදක් වුවද, බලපත්‍රයක් නොමැති ගුවන් ප්‍රවාහන සේවා සපයන්නන්ට එරෙහිව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 97 වැනි වගන්තියේ දක්වා ඇති විධිවිධාන අනුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. නිසි වලංගු බලපත්‍රයක්, A කාණ්ඩයේ සේවා සපයන්නන් 1458 න් 947 ක් සහ B කාණ්ඩයේ සපයන්නන් 183 න් 164 ක් 2023 දෙසැම්බර් 31 දිනට බලපත්‍රය අලුත් කර නොමැති බව නිරීක්ෂණය විය. සේවා සපයන්නන් විසින් පවත්වාගෙන යන බව තහවුරු කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. නිසි වලංගු බලපත්‍රයක් නොමැති ව්‍යාපාරය. බලපත්‍රය අලුත් කිරීම හෝ අවලංගු කිරීම නොකළ ඉහත සේවා සපයන්නන්ට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. පසුගිය වසරවල සේවා සපයන්නන් බලපත්‍ර නොමැතිව සිදුකරන ලද ව්‍යාපාර කටයුතු සඳහා දඩ මුදල් අයකිරීමෙන් ඒ බව තහවුරු වූ අතර බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අධිකාරියට සේවා සපයන්නන්ට සිදුවූ බව වැඩිදුරටත් තහවුරු විය. | ප්‍රමාණවත් ආදායමක් නොමැතිකම, තරඟකාරීත්වය, කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ අපහසුතාව සහ ව්‍යාපාරික ගැටළු වැනි විවිධ හේතු නිසා බොහෝ ගුවන් ටිකට්පත් නිකුත් කරන ආයතන කර්මාන්තයට ඇතුළු වී කෙටි කලකින් ඉවත් වේ. ලියාපදිංචි ආයතන 2300කට ආසන්න සංඛ්‍යාවෙන් 500-600ක් පමණක් ක්‍රියාත්මක වන්නේ මන්දැයි මෙයින් පැහැදිලි වේ. අළුත් නොකරන ලද බලපත්‍ර අධිකාරියට අහිමි ආදායම නියෝජනය නොකරයි, මන්ද එම ආයතන සාමාන්‍යයෙන් තවදුරටත් ක්‍රියාත්මක නොවන නිසා ඒවායින් ගාස්තු අය කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින්, මෙම කාර්යාලය පාලනය කළ නොහැකි හේතූන් මත ආයතනයක් විසින් ව්‍යාපාර වසා දැමීම ආදායම් පාඩුවක් ලෙස නොසැලකිය හැකි අතර, CAASL හි මූල්‍ය හා ආදායම් කළමනාකරණය මගින් එවැනි ආදායමක් ප්‍රක්ෂේපණය නොකෙරේ. බලපත්‍ර අලුත් කිරීමට අපොහොසත් වන ව්‍යාපාර සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ DGCA හි විශේෂ උපදෙසක් ලෙස 2023 මැයි මාසයේදී. (i) කල් ඉකුත් වූ බලපත්‍රලාභීන්ට අලුත් කිරීම සඳහා මාසයක සහන කාලයක් ලබා දෙන ලදී. එසේ කිරීමට අපොහොසත් වන නියෝජිතායතන අක්‍රිය ලෙස ලියාපදිංචි කරනු ලැබේ. ආයතන 922කට දැනුවත් කිරීමේ නිවේදන යවා ඇතත් ඒවා ලබා නොදීම නිසා 556ක් ආපසු එවා ඇත. නියෝජිතයින් 922 දෙනෙකුගෙන් නියෝජිතයින් 45 දෙනෙකු තම බලපත්‍රය අලුත් කර ඇති අතර නියෝජිතයින් 877 දෙනෙකුට ප්‍රතිචාර දැක්වීමක් හෝ නොතීසි ලබා නොදීම හෝ බලපත්‍රය අලුත් කර නොතිබුණි. එබැවින් | අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නියෝජිතයින් 877 දෙනෙකු ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. මේවා ක්‍රියා නොකරන ලෙස වර්ග කර ඇත. (ii) සෑම මාස හයකට වරක් GDS සපයන්නන්ගෙන් ලැයිස්තුවක් ලබා ගන්නා අතර, යාවත්කාලීන නොකළ බලපත්‍ර ඇති ආයතනවලට ඔවුන්ගේ පද්ධති විසන්ධි කිරීමට උපදෙස් දෙනු ලැබේ. | |
| (ඉ) | බලපත්‍රලාභීන්ට වලංගු බලපත්‍රයක් තිබේද යන්න සහ නියමිත දිනට ඔවුන් අලුත් කර තිබේද යන්න තහවුරු කර ගැනීමට අධිකාරිය විසින් බලපත්‍රලාභීන් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. ඉහත නිරීක්ෂණවලට අනුව අධිකාරිය පසුගිය වසර තුළ බලපත්‍ර නිකුත් කිරීමේ සහ නඩත්තු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර නොතිබුණි. එබැවින් අධිකාරිය අලුත් කිරීමේ ගාස්තුවක් එකතු කර නොතබීම නිසා රු. 78,366,175 ක් අහිමි වී තිබුණි. | කල් ඉකුත් වූ බලපත්‍රලාභීන්ට අලුත් කිරීම සඳහා මාසයක සහන කාලයක් ලබා දෙන ලදී. එසේ කිරීමට අපොහොසත් වන නියෝජිතායතන අක්‍රිය ලෙස ලියාපදිංචි කරනු ලැබේ. ආයතන 922කට දැනුවත් කිරීමේ නිවේදන යවා ඇතත් ඒවා ලබා නොදීම නිසා 556ක් ආපසු එවා ඇත. නියෝජිතයින් 922 දෙනෙකුගෙන් නියෝජිතයින් 45 දෙනෙකු තම බලපත්‍රය අලුත් කර ඇති අතර නියෝජිතයින් 877 දෙනෙකුට ප්‍රතිචාර දැක්වීමක් හෝ නොතීසි ලබා නොදීම හෝ බලපත්‍රය අලුත් කර නොතිබුණි. එබැවින් නියෝජිතයින් 877 ක් ඉවත් කරන ලදී | අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම. |
| (ඊ) | අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතායතන බලපත්‍ර හිමියාට ව්‍යාපාරය කරගෙන යාමට ප්‍රමාණවත් කාර්යාල ඉඩකඩක් තිබිය යුතු වුවද, අධිකාරිය විසින් 2023 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර හිමි 505ක් බලපත්‍රලාභීන් මෙම කොන්දේසිය සපුරා ඇත්දැයි තහවුරු කරගෙන නොතිබුණි. | දිවයින පුරා ගුවන් ප්‍රවේශපත්‍ර නියෝජිතායතන බහුලව පැතිරීම හේතුවෙන් ස්ථානීය පරීක්ෂා කිරීම් ප්‍රායෝගික නැත. සිවිල් ගුවන් සේවා අධිකාරියට එවැනි පරීක්ෂණ කිරීමට අවශ්‍ය මානව පිරිස් හා සම්පත් හිඟයි. මේ ආකාරයට බලපත්‍රලාභීන් පරීක්ෂා කිරීමද අභියෝගාත්මකය. කෙසේ වෙතත්, අධිකාරිය හැකිතාක් බලපත්‍ර නොමැති ආයතන ඇමතීමට උත්සාහ කරනු ඇත. | අධිකාරිය 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අනුගමනය කළ යුතු වීම. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (a) | අධිකාරිය විසින් යාපනය ගුවන් තොටුපළේ තාවකාලික මගී පර්යන්තයක්, ගිනි නිවන ගොඩනැගිල්ලක් සහ පර්යන්ත මාර්ගයක් ඉදිකිරීම සඳහා AASL වෙත රු. 215,710,963. අත්තිකාරම් ලබා දී තිබුණි. | ව්‍යාපෘති ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව (PPEC) සහ ව්‍යාපෘති ප්‍රසම්පාදන අනුමත කමිටුවේ (PPAC) ඇගයීම සහ අනුමැතිය හරහා යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය සඳහා වෙන් කළ අරමුදල් CAASL විසින් නිදහස් කරන ලදී. කමිටු අවසන් වරට අමාත්‍යාංශය විසින් පත් කරන ලද්දේ 2020 ජූලි 13 දින දිය. සංචාරක හා ගුවන්සේවා අමාත්‍යාංශයේ කමිටුවල සාමාජිකයන් නොමැති බැවින් අත්තිකාරම් පියවීම් අවසන් කිරීමට කමිටු පත් කරන ලෙසට රේඛීය අමාත්‍යාංශය වෙත | නියමිත කාල සීමාව තුළ හෝ අදාළ වැඩසටහන අවසන් වූ විට අත්තිකාරම් පියවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා පැවැත්වේ. | |
| (b) | ගුවන් සමාගම් හතරක් අපගමන බද්ද ගණනය කිරීම සඳහා පියාසැරි දිනයේ පැවති විනිමය අනුපාත යොදාගෙන තිබුණු අතර, එම මුදල රු. 1,504,761,392 කි. මෙය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද EL/01/2023 නියෝගයෙහි දක්වා ඇති අනුපාතයට පටහැනි වේ. | CAASL විසින් මුදල් පනතේ 4 වගන්තියේ (3) උපවගන්තිය සහ අපගමන බදු රෙගුලාසි මගින් ප්‍රමාද වූ පොලිය අයකර ගැනීමට අඛණ්ඩ පියවර ගෙන ඇත. මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයටද දැනුම් දී ඇත. හිඟ අපගමන බදු පියවීම සඳහා අදාළ ගුවන් සමාගම් වෙත අවසන් සිහි කැඳවීම් කිරීම් යවා ඇති අතර නීතිපතිතුමා වෙතද මෙම ගැටලුව සම්බන්ධයෙන් ලිපියක් යවා ඇත. | අධිකාරිය විසින් විධිමත් යාන්ත්‍රණයක් හරහා එක් එක් ගුවන් සමාගම විසින් ප්‍රේෂණය කරනු ලබන අපගමන බද්දේ නිරවද්‍යතාවය පරීක්ෂා කර තහවුරු කරගත යුතු වීම. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් (අධිකාරිය) වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 24,217,285 ක් වැය වූ අතර එහි මුළු අයවැය ප්‍රතිපාදනය රු. මිලියන 7.5 කින් ඉක්මවා තිබුණි. මෙම ඉදිකිරීම සඳහා එක් ලංසුකරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, අධිකාරිය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව එම කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. තවද, දෙපාර්ශවය විසින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම දෙපාර්ශවය විසින්ම අත්සන් කර නොතිබුණි. 2022 මැයි 18 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව, ද්‍රව්‍යමය පිරිවැය තුන් ගුණයකින් වැඩි වුවද, මාස 10කට පසු එම ලංසු මිලටම ලංසුකරු 2023 මාර්තු 13 දින වැඩ ආරම්භ කර තිබුණි. අමතර වැඩ ඉල්ලීමකින් තොරව රු. 2,193,750 කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර ඇති අතර, අතිරේක වැඩ සඳහා TEC සහ PC මෙම BOQ අනුමත කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.2 ප්‍රකාරව සම්පූර්ණ කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි. තවද, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 11(1) වගන්තියට අනුව කොන්ත්‍රාත් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.2 අනුව, ජාතික තරඟකාරී ලංසු (NCB) යටතේ මිල ගණන් කැඳවන විට, එක් ලංසුවක් පමණක් ලැබුණද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය යම් යම් කොන්දේසි යටතේ ඉදිරියට යා හැකිය. මෙම මාර්ගෝපදේශය තරඟකාරීත්වය සීමිත බව පෙනෙන අවස්ථා වලදී පවා ප්‍රසම්පාදනය සාධාරණ සහ කාර්යක්ෂම බව සහතික කරයි. ආර්ථික අර්බුදයට පෙර පැවති ඒවා මත පදනම්ව DPC අනුමත කරන ලදී. රටේ වත්මන් වෙළඳපල තත්ත්වයන් අනුව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමෙන්, එම ලංසුකරුට නැවත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට DPC තීරණාත්මක තීරණයක් ගත්තේය. විවිධ කරුණු සලකා බලා තත්ත්වය පිළිබඳ පුළුල් තක්සේරුවකින් පසුව මෙම තීරණයට එළැඹ ඇත. ලංසුකරු C7 මට්ටමේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ )CIDA) ලියාපදිංචි වී ඇත. CIDA යනු ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය පාලනය කරන සහ නියාමනය කරන බලයලත් ආයතනය වන අතර, සියලුම ලියාපදිංචි ආයතන තත්ත්ව, විශ්වසනීයත්වය සහ වෘත්තීයභාවය පිළිබඳ දැඩි ප්‍රමිතීන් සපුරාලන බව සහතික කරයි. නානකාමර 12 ක බිත්ති ටයිල් වැඩ නිම කිරීම සඳහා මුල් ව්‍යාපෘති විෂය පථයේ වෙනසක් ලෙස දීර්ඝ කිරීම ලබා දී ඇත. මෙම කාර්යය මුලින් පවරන ලද කාර්යයන් වලින් අන්‍යෝන්‍ය වශයෙන් බැහැර වන අතර එම නිසා මුල් ව්‍යාපෘතියට අදාළ කාල සීමාව විචලනය කිරීමේ කාර්යයට අදාළ නොවේ. ගොඩනැගිල්ල | ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශයේ අවශ්‍යතාවලට අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි සහතිකය ලබාගෙන නොතිබූ අතර, කොන්ත්‍රාත්කරු විසින් ලබා දුන් කාර්ය සාධන සහතිකය වැඩ නිම කිරීමට පෙර කල් ඉකුත් වී තිබුණි. සනීපාරක්ෂක උපකරණ සැපයීම සහ සවිකිරීමේ අවශ්‍යතා නොමැතිව රු. සනීපාරක්ෂක උපකරණ ආදේශ කිරීම සඳහා රු. 1,792,000 ක් ගෙවා තිබුණි. | ඉදිකිරීමෙන් වසර අටකට පසු, සින්ක්, වැසිකිලි සහ අනෙකුත් නාන කාමර උපාංග ඇතුළු සනීපාරක්ෂක උපකරණවල සැලකිය යුතු පිරිහීමක් ඇති බව පුළුල් පරීක්ෂණයකින් හෙළි විය. හඳුනාගත් ගැටළු වූයේ දුර්වර්ණ වීම, පිළිස්සීම සහ ඉරිතැලීමයි. දුර්වර්ණ වීමෙන් ද්‍රව්‍ය පිරිහීම, පිළිස්සීම යෝජිත අධික උෂ්ණත්වයට නිරාවරණය වීම සහ ඉරිතැලීම් ක්‍රියාකාරීත්වය සහ සෞන්දර්යය යන දෙකම අඩාල කරයි. මෙම ගැටළු සනීපාරක්ෂක භාණ්ඩවල භාවිතය සහ පෙනුම අඩු කළ අතර, ප්‍රතිස්ථාපනය අත්‍යවශ්‍ය වේ. බංගලාව එහි පදිංචිකරුවන්ට සහ CAASL හි ප්‍රතිරූපය සඳහා හොඳ තත්ත්වයේ පවතින බව සහතික කරමින්, සනීපාරක්ෂක ප්‍රමිතීන්, ක්‍රියාකාරීත්වය සහ දෘශ්‍ය ආකර්ෂණය යථා තත්ත්වයට පත් කිරීම සඳහා නව, උසස් තත්ත්වයේ සවි කිරීම් ස්ථාපනය කිරීම අවශ්‍ය යැයි සලකනු ලැබීය. | |
| (ආ) | 2016 වසරේ සිට වීරවිල සංචාරක බංගලාවේ කළමනාකරණ හා නඩත්තු කොන්ත්‍රාත්තුව අලුත් කිරීමකින් තොරව අධිකාරිය විසින් රු. 5,960,000 ක් ගෙවා තිබුණි. මීට අමතරව, රු. 1,155,000 ප්‍රතිසංස්කරණ කාලය තුළ සේවා සපයන්නා වෙත වලංගු ගිවිසුමක් නොමැතිව ගෙවා තිබුණි. | වීරවිල සංචාරක බංගලාව මූලික වශයෙන් කළමනාකරණය කරනු ලබන්නේ රාජකාරියේ යෙදී සිටින අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාසයක් ලෙස හා CAASL කාර්ය මණ්ඩලය සඳහා සහනදායී මිලකට නිවාඩු බංගලා පහසුකම් සැපයීම සඳහාය. තවද, 2024 මැයි මාසයේ දී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ බැවින් සමාලෝචිත කාල සීමාව තුළ කුඅඩු වෙන් කිරීම් ප්‍රමාණයක් සිදු කරන ලදීඑබැවින් ., මෙම කාල සීමාව තුළ නිල රාජකාරි සඳහා කාර්ය මණ්ඩල නවාතැන් සැපයීම හැර, වෙන් කිරීම් සිදු කර නොමැත. එපමණක් නොව, වෙන් කිරීම් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා බංගලාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇති අතර 2024 සිට වෙන්කිරීමේ ගාස්තු ද වැඩි කර ඇත. | නිසි යාන්ත්‍රණක්ය හඳුන්වා දී මුදලට සරිලන වටිනාකමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |